# නොසන්සිදෙන අලි මිනිස් ගැටුම පරිසර හිතකාමීව විසඳේද?

ප්‍රාග් ඓතිහාසික පසුබිම.

තිරිසන් සතුන්ගෙන් තොර ලොවක මිනිසුන්ට ජීවත් විය හැකිද? සියලු තිරිසන් සතුන් විනාශ වී ගියහොත් ජීවිතයේ දැඩි හුදකලා බවින් මිනිසා ද විනාශ වී යනු ඇත. රතු ඉන්දියානු නායක සියැටල් වරෙක ප්‍රකාශ කලේ මෙලෙසිනි. එය සත්‍යයකි. පරිසරය අයිති මිනිසාට පමණක් නොව සතුන් ද පරිසරයේම කොටසක් වන්නෝය. ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා විහිදෙන සත්ත්ව ලෝකය තුල දැවැන්තයා අලියාය. එලිෆන්ට් මැක්සිමස් යන විද්‍යාත්මක නාමයෙන් හැඳින්වෙන්නේ ද අලියාය. මේ ශත වර්ෂය මුල සිටම අපේ රටේ අලි ඇතුන් විශාල සංඛ්‍යාවක් වාසය කළ බවට වාර්තා ඇතත් එය ශීඝ්‍ර ලෙස පහත යාමේ තර්ජනයකට අද වන විට මුහුණ පා ඇත.

වර්තමානය වන විට අලියා මිහිතලය හැර යයිද?

අලි ඇතුන් පිළිබඳ අතීත කතාව පොළව අයිස්වලින් වැසී ගිය කාලය දක්වාම දිව යන්නකි. ලෝකයේ අලි ඇතුන් දෙවර්ගයක් සිටිතිග අප්‍රිකානු අලියා සහ ආසියානු අලියා මේ දෙවර්ගයයි. අප්‍රිකානු අලියා ආසියානු අලියාට වඩා ශරීර ප්‍රමාණයෙන් විශාලය. වැඩුණු පිරිමි සතෙකුගේ උස අඩි 11.5 ක්ද බර ටොන් 7 ක්ද වෙයි. ඔවුනගේ කන් පෙති ඉතා විශාල වන අතර දළ යුගල ද ඉතා විශාලය. දළ යුගල දිගින් වැඩිය. සලෙහි ඇති කෙඳි ප්‍රමාණය ආසියානු අලියාට වඩා අඩුය. දැනට ආසියාවේ අලි ගහනය 30000 සිට 50000 අතර ප්‍රමාණයක් වන අතර පසුගිය සියවස ආරම්භයේ දී ශ්‍රී ලංකාවේ අලි 12000 ක් පමණ සිටි බවට වාර්තා වී ඇත. එනමුත් වත්මනෙහි ශ්‍රී ලංකාවේ වනගත අලි ගහනය 2000 2500 අතර ශීඝ්‍ර පහත බැසීමක් වී ඇති බව පෙන්වා දිය හැකිය. සොබා දහමේ සොඳුරුතම නිර්මාණයක් වන අලියාගේ දළ (එනම් උඩු හනුවේ කාන්තක දත් යුගල) නිසාම නුදුරු දිනකදී අලියා මිහිතලය හැර යයිද?

## ගැටුමක්

අලි ඇතුන් අපේ රටේ ස්වභාවික පරිසරයේ මෙන්ම සංස්කෘතියේ හා ඉතිහාසයේද ප්‍රධාන ස්ථානයක වැජඹෙන හා ගෞරවයට පාත්‍ර වී ඇති සත්ත්ව කොට්ඨාශයකි. බෞද්ධ සාහිත්‍යයට අනුව සිද්ධාර්ථ කුමරු මහාමායා දේවියගේ කුස තුළ පිළිසඳ ගැනීම සංකේතවත් කරන්නේ නෙළුම් මලක් රැගත් සුදු ඇත් පැටවෙකු එතුමියගේ කුස තුලට ඇතුලු වීම මගිනි. එපමණක් නොවේ; අපේ රටේ මුදුන් මල් කඩ වන් ශ්‍රී දළදා පෙරහැරෙහි දළදා කරඬුව ගෙන යන්නේ ද ඇතු පිටිනි. අතීතයට දිව ගිය කල අපේ ආදි රජ දරුවන් පරදේශීන්ගෙන් ලක බේරා ගැනීම සඳහා සන්නද්ධ වූ සෑම අවස්ථාවකදීම සිව්රඟ සේනාවන්ගෙන් එකක් ලෙස ඇත් සේනාව විශාල සහයක් ලබා දුන් බව අතීත මූලාශ්‍රයන්ගෙන් හෙළි වේ.

විජිතපුර සංග්‍රාමයට එකතු වූ කණ්ඩුල හස්තියා ඊට හොඳ නිදසුනක් වේ. එසේම ඈත අතීතයේදී අපේ රටේ ජනාවාස විශාල වශයෙන් ගොඩ නැගුණේ වියළි කලාපයේය. එයට හේතුව වූයේ කෘෂිකාර්මික බිම් වැඩි ප්‍රමාණයක් මෙම කලාපයේ දක්නට ලැබීමයි. මිනිසුන් වියළි කලාපයේ ගම්බිම් තනා ගනිද්දී අලි ඇතුන් තෙත් කලාපය තම වාසය සඳහා යොදා ගති. මේ නිසා ස්වයංපෝෂිත ආර්ථික රටාවක් පැවැති ශ්‍රී ලංකාව තුල අලි මිනිස් ගැටුමක් පැවැති බවට සාක්ෂි නැති නමුත් පසුව තෙත් කලාපය වැවිළි කර්මාන්තය සඳහා වෙන් වූවාට පසු වෙසෙසින්ම මධ්‍යම කඳුකරය වෙන් වූවාට පසු වියළි කලාපයේ රාජධානි බිඳ වැටීමෙන් තෙත් කලාපය ජනාවාස වීමත් සමගම වියළි කලාපයට මෙම අලි ඇතුන් සංක්‍රමණය වූ බවට සාක්ෂි ඇත. අලි ඇතුන්ගේ

ආහාර සඳහා යොදා ගත් විවිධ තෘණ වර්ග ලපටි ශාක මෙන්ම අත්හැර දැමූ ජලාශ පුරුල් එළිමහන් බිම්ද අලින්ට හිතකර පාරාදීසයක් වූ බැවින් වියළි කළාපයේ ඇති වූ ද්විතියික වනාන්තර අලින්ගේ නිජ භූමි බවට පත්වූයේ නිතැතිනි. පසු කාලීනව ඇති වූ අලි මිනිස් ගැටුමෙහි ආරම්භය වූයේ ද මෙම සංසිද්ධිය බව පරිසර විද්‍යාඥයින්ගේ මතයයි.


පෙර නිමිති

ආදියේ පටන් ඉන්දීය සයුරේ මුතු ඇටය නමින් ලොව පුරා පසිඳු මනරම් දිවයිනක් වූ ශ්‍රී ලංකා නිජ භූමිය බ්‍රිතාන්‍යයන් විසින් අත්පත් කර ගැනීමත් සමගම ඇති වූ වැවිලි බෝග වගාව හේතුකොටගෙන සුන්දර කඳුකර වනාන්තර විනාශ වන්නට පටන් ගත්තේ නිරායාසයෙනි. අලි ඇතුන්ගේ වාසස්ථානයන්ට ද කණකොකා හඩවමින් දහස් ගණනක් අලි ඇතුන් ස්වකීය වාස භූමි අතහැර යන්නට වූහ. බ්‍රිතාන්‍යය වැවිලිකරුවන්ට මුල් යුගයේ අලින් මහත් හිසරදයක් වූ බව පැහැදිලිය. වර්ෂ 1848 - 1859 දක්වා වූ කාලය තුල අපේ රටේ ජීවත් වූ අලි ඇතුන් 5194 ක් පමණ සංඛ්‍යාවක් මරා තිබෙන බව වාර්තාවල සඳහන් වේ. මරා දැමූ අලි ඇතුන්ගේ දළ අලෙවි කිරීමටද ඔවුන්ගේ ආර්ථික ශක්‍යතාව උපරිම කර ගැනීමේ තවත් එක් අවස්ථාවක් විය. අලි ඇතුන් අල්ලා එතෙරට විකිණීමද මෙම යුගය තුල සුලභවව දක්නට ලැබුණු තවත් සංසිද්ධියකි. එහි අවසාන ප්‍රතිඵලය වූයේ අලි තෙත් කළාපයෙන් වඳ වී යාමයි.

අතරමං වූ අලි

තෙත් කළාපයෙන් මං මුලා වූ අලි ඇතුන් වියළි කළාපයේ ඉතිරි වූ බිම් ප්‍රදේශවල කොටු වූ බව කිව හැක. බ්‍රිතාන්‍යය පාලනයෙන් ඇති කල අනිටු ප්‍රතිඵල වියළි කළාපය තුල වර්තමානයේ පවතින අලි මිනිස් ගැටුමේ ආරම්භය දක්වා විකාශනය වූ බව පෙනී යන කරුණකි. එනිසාම වියළි කළාපයේ ප්‍රදේශවලදී අද අපට අලි මිනිස් ගැටුම බහුලව දැකීමට පිළිවන. මෙය ගැටුමක් දක්වා වර්ධනය වීමට මූලිකව බලපෑවේ ශීඝ්‍ර ජනගහන වර්ධනයයි. ජනගහන වර්ධනයට සාපේක්ෂව ඉඩම් සීමිත වීම මෙම අර්බුදයට ප්‍රධාන හේතුවයි. මේ සියවස මුල් භාගයේ මේ රටේ වන ආවරණය 70% ක් වූ අතර එය 1956 වසර වන විට මුළු භූමි ප්‍රමාණයෙන් 44%ක් ලෙසද 1983 දී කරන ලද සංගණනයට අනුව එය මුළු භූමි ප්‍රමාණයෙන් 27%ක් ලෙසද අවසාන වශයෙන් 1992 දී කරන ලද සංගණනයට අනුව 23.9% දක්වාත් අඩු වී ඇත. ඒ වන විට ඉතිරි වී ඇති විවෘත කැලෑ ප්‍රමාණයත් සමග ගත් කළ මුළු වන ආවරණය ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් 30.8% ක් පමණ වේ. ඒ අනුව බලන කල 1956 සිට 1992 දක්වා වකවානුව තුල වසරකට හෙක්ටයාර් 40000 ක් බැගින් වනාන්තර විනාශ වූ බවට වාර්තා වන අතර, නැවත ස්ථාපිත කරනුයේ වසරකට හෙක්ටයාර් 2000 - 10000 ප්‍රමාණයක් වේ. මෙසේ ශීඝ්‍ර ලෙස වන වැස්ම එළි පෙහෙළි වීම අලි ඇතුන්ගේ ජීවන අරගලයට ප්‍රධාන හේතුවක් වූ බව පෙනෙයි. මහවැලි ව්‍යාපාරයේ බලපෑමට ලක් වූ ගල්ඔය ව්‍යාපාරය වලවේ සහ කිරිඳි ඔය වැනි ව්‍යාපාරයන් තුළින් ප්‍රමාණාත්මක සංවර්ධනය සිදු වුවද, එහි ගුණාත්මක සංවර්ධන සමබරතාවය බිඳ වැටුණු එක් අවස්ථාවක් වේ. මන්ද යත් මෙහිදී අලි ඇතුන්ගේ වාසස්ථාන විශාල වශයෙන් අහිමි වූ බැවිනි. මීට අමතරව අලි ඇතුන්ගේ වාසස්ථාන අහිමි වූ තවත් අවස්ථාවක් වන්නේ මොණරාගල දිස්ත්‍රික්කය තුල ඇරඹි උක් වගාවයි. එම ප්‍රදේශවල සිටි අලින්ගේ වාසස්ථාන අහිමි වී යාමට මෙයද හේතුවක් වූවේය. එනිසා එම ප්‍රදේශවලත් අලි මිනිස් ගැටුම නිර්මාණය වූ බව පෙනේ. පරිසර හිතකාමී විද්‍යාඥයින් පවසන

ආකාරයට මෙම අලි මිනිස් ගැටුම අවම කිරීමට නම් අලින්ට ඔවුන් ජීවත් වූ ප්‍රදේශ නැවත දිය යුතුය. එනමුත් ප්‍රායෝගිව සලකා බැලීමේදී මෙම ප්‍රදේශවල ජීවත් වන ජනයාගේ නිවාස ප්‍රශ්නයද අලි ඇතුන්ගේ වාසස්ථාන තරමටම ප්‍රබල අවශ්‍යතාවක් බවට පත් වී තිබේ. එනම් මෙම අවශ්‍යතා දෙකම එකම තලයක ගමන් කරන බැවිනි




(ලිඛිත මූලාශ්‍ර ඇසුරිනි)

මෙම රූප සටහනෙන් අලි මිනිස් ගැටුමෙන් 1992 වර්ෂයේ සිට 2001 දක්වා මරණයට පත් වූ මිනිසුන්ගේ සංඛ්‍යාවත් මරා දමන ලද අලින්ගේ ගණනත් දැක්වේ. අලින්ගේ මරණ සංඛ්‍යාවේ වැඩි වීමක් පෙන්නුම් කරයි. වසරකට අවම වශයෙන් අලින් 120ක් මරා දමා ඇති අතර අලින් විසින් මිනිසුන් 65 දෙනෙකු වර්ෂයකට මරා දමන බවක් පෙනෙයිග මෙම තත්ත්වය අද වන විට (2005 වන විට) තවත් වෙනස් වී ඇති බව වර්තමාන ලිඛිත මූලාශ්‍රවලින් පෙන්වා දිය හැක. ඉකුත් වසරේ අලි මිනිස් ගැටුමෙන් මියගොස් ඇති වල් අලි ගණන 146 ක් පමණ වන අතර මියගොස් ඇති පුද්ගලයන් ගණන 50කි. වැඩිම අලි මිනිස් මරණ සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ වයඹ වන ජීවී කලාපය තුළිනි. දැනට වන ජීවී කලාප තුළ ජීවත් වන වල් අලි සංඛ්‍යාව 3500 පමණ වන අතර එම අලින් සඳහා අවශ්‍ය කරන ආහාර ජලය සීමා සහිත වීම යටතේ ගම්මානවලට වල් අලි කඩා වැදීමෙන් අලි මිනිස් ගැටුම් මෙන්ම මරණ ද සිදු වන බව නූතන පරිසර සංවිධාන මගින් පෙන්වා දෙයි.

විළිතුරු

වර්තමානය වන විට අලි මිනිස් ගැටුමට විවිධ විසඳුම් සෙවීම පරිසරයට සොබා දහමට ආදරය කරන කාගේත් වග කීමක් බවට පත් වෙමින් පවතී. මූලිකවම මිනිසුන්ගෙන් අලින්ට වන හිරිහැර අවම කර ගැනීම ප්‍රධාන අරමුණ වී ඇත. ඒ සඳහා විවිධ ක්‍රියාමාර්ග යොදාගෙන ඇත. විශේෂයෙන්ම හානි කරන අලින් අල්ලා ජාතික වනෝද්‍යාන වලට මුදා හැරීම, එසේම අලි රංචු රක්ෂිතයන් වෙත පළවා හැරීම, වෙඩි භාවිතා කර අලි ඇතුන් පන්නා දැමීම ආදියයි. පසුගිය වකවානුව තුල මේ සඳහා තවත් සුවිශේෂ වූ කටයුත්තක් සිදු කරනු ලැබිණි. එනම් වියළි කළාපයේ අලුත් ජාතික වනෝද්‍යානයක් සහ වන රක්ෂිතයක් ඇති කිරීමයි. රට අමතරව පරිසර සහ ස්වභාවික සම්පත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අලි 400ක් පමණ ජීවත් වන හොරොව්පතාන හුරුළුවැව වන රක්ෂිතයක් බවට පත් කොට එය පරිසර හා ස්වභාවික අමාත්‍යාංශයට යටතට පවරා ගනු ලැබිණි. මෙවැනි දේ පැසසිය යුතු වේ.

බාධාවන්

අද වන විට අලි මිනිස් ගැටුම විසඳීමට යොදා ගත් විකල්පයන් සාර්ථක වූවාද යන්න නැවත වරක් විමසා බැලිය යුතු කරුණක් වේ. එයට හේතුව අලින්ගේ හිරිහැර නිසා අසරණ බවට පත් වන ජනතාව මෙන්ම ඔවුන්ගේ දේපළ වලට වන හානියද මෙතෙක් ක්‍රමානුකූල තක්සේරු ගත කිරීමක් සිදු කොට නොමැත. එසේම රක්ෂිත ප්‍රදේශවල දිගින් දිගටම සිදු වන අනවසර පදිංචි වීම් ආදිය අලි මිනිස් ගැටුම අවම කිරීමට ගන්නා පියවරවල් වලට සාජුවම බාධාවක් වී තිබේ. එසේම අලියා සහ මිනිසා අතර පවතින මෙම ගැටුම සමථයකට පත් කල යුතු බව පිළිගන්නා බෙහෝ පරිසර වේදීන් පවසනුයේ අලින්ට වනෝද්‍යාන හරහා මාරු වීමට අවශ්‍ය වනතීරු (Forest Corridors) ඇති කිරීමට උනන්දු විය යුතු බවයි.



අලියා අපේ පරිසර පද්ධතියේ සමතුලිතතාව ඇති කිරීම සඳහා මූලිකව ක්‍රියා කරන සත්ත්වයෙකි. එය විද්‍යාත්මකව වුවද ඔප්පු කිරීමට පුළුවන. එසේනම් අලින්ගේ පැවැත්ම පරිසර පද්ධති ආරක්‍ෂා කර ගැනීමටත් හේතුවක් වී තිබෙන බව සපථ වේ. එසේනම් අලින් ආරක්‍ෂා කිරීම යනු අපේ පරිසර පද්ධතීන් ආරක්‍ෂා කිරීමකි. අනෙක් අතට අපේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමටත් සංචාරකයින් සුලභ වශයෙන් ශ්‍රී ලංකාව වෙත නැඹුරු කර ගැනීමටත් අලි සම්පත අපි ආරක්‍ෂා කල යුතුමය. ඒ නිසා අපේ අලි පරපුර ආරක්‍ෂා කර ගැනීම පාරිසරික මෙන්ම ආර්ථික සංස්කෘතිමය උරුමයක් ආරක්‍ෂා කර ගැනීම වන්නේය.

එස්. ඩී. මුතුනායක වැඩසටහන් සහකාර (මාධ්‍ය)
ප්‍රවර්ධන සහ පරිසර අධ්‍යාපන අංශය,
පරිසර සහ ස්වභාවික සම්පත්
අමාත්‍යාංශය.

## සංක්‍රමණය !...

අහස පොළොව හා සැතපෙන
මිරිගුව නැමැති විමානයක සිට
පැදවූයෙමු රියසක
සොයා ගත සිත පිනවන
විමානයක් .................
ඔබ මා සරි කරනු රිසියෙන්

දුටුවෙමු.

ඇත කඳුහෙල් පිරුණු
තුරුලිය ගොමු රටා මැවුණු
නිල් පලසක්
ලංව ආවෙමු සවනත
කුරුළු ගී නද ඇසුණු
විහඟ ගී රාවයෙන්
දනන් මන තුටු කරන

අහෝ නොඉඳුල් වන රැජිනියණි,

පිපාසයෙන් මත් වූ
මුදල් හඹා යන ලෝකයේ
කොන්ක්‍රීට් කණු අතර
මහල් ප්‍රසාද තුළ
හිර කළත් ඔබ
ගත සිත සනසා
රුදුරු මිනිසුන්ගේ ලෝකයේ,
සරදමක් විය නිමේෂයකට
ඔබ.................

එහෙත් වන දෙව්ලියේ
සොබාදම් දිනිතිය
නැමති නීතිය අභියස
නිරුත්තර වූ
වග උත්තර කරුවෝ
නොවෙද අප
එබැවින් යා යුතුය
සොයා හරි මගක්
හෙට දින මැවෙන
අපේ ඒ ලෝකයට

ඩී. මනෝජා ජයසේකර,
වැඩසටහන් සහකාර (පරිසර)
**ප්‍රවර්ධන සහ පරිසර අධ්‍යාපන අංශය,**
පරිසර සහ ස්වභාවික සම්පත්
අමාත්‍යාංශය.